# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1990/7 - 2016 ඔක්තෝබර් මස 24 වැනි සඳුදා - 2016.10.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට මකුල්ඇල්ල ජල සම්පාදන ක්‍රමයේ පීඩන පොම්පාගාරයක් ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 ඔක්තෝබර් මස 17 වැනි දින,
අංක 35, "ලක්දිය මැඳුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1219

**උපලේඛනය**

බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, අංක 70, බඹරගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, බඹරගම ගමේ පිහිටි බඹරගම අම්පිටිගොඩවත්ත නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 10ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | එම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | බඹරගම පාර ; |
| *දකුණට* | : | එම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | එම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,
ග්‍රෙගරි මාවත,
කොළඹ 07.

11 -417


1A - G 24433— 17 (2016/10)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට යෝජිත මාතර IV වන අදියර ජල සම්පාදන ක්‍රමය යටතේ උනින්දුවෙල ජල පවිත්‍රාගාරය, ගබඩා ටැංකිය, පරිපාලන ගොඩනැගිල්ල, යන්ත්‍රාගාරය, පොම්පාගාරය හා නිල නිවාසය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන ඉඩම් කොටස අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 ඔක්තෝබර් මස 17 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1252.

### උපලේඛනය

මාතර දිස්ත්‍රික්කයේ, මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 350A, කටුවන්ගොඩ ග්‍රාම නිලධාරී වසමේ කටුවන්ගොඩ ගමේ පිහිටි කටුවලගේවත්ත සහ පුංචිලමාහාමිලාගේ කොරටුව නමැති ඉඩමේ සම්පූර්ණ ප්‍රමාණයෙන් අක්කර 03, රූඩ් 02ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස ඃ

| | | |
|---|---|---|
| *උතුරට* | ඃ | හොන්පලහේන සහ එලෝකන්ද වත්ත ඉඩම ; |
| *නැගෙනහිරට* | ඃ | එලෝකන්ද වත්ත ඉඩම සහ ප්‍රධාන පාරේ සිට කටුවන්ගොඩ දක්වා දිවෙන පාර ; |
| *දකුණට* | ඃ | කටුවන්ගොඩ දක්වා දිවෙන පාර සහ බේරුවලගේ වත්ත ඉඩම ; |
| *බටහිරට* | ඃ | ඉහලගේ වත්ත සහ කොටපොලගේ වත්ත ඉඩම. |

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනය*ඃ එන්. බී. පලිහවඩන සහ රාමසිරි පලිහවඩන මයා,
බංගලාව, මාලිම්බඩ පාර,
කද්දුව - තෙලිජ්ජවිල.

11 -418